කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011

2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ දර්ශනය - BUPH E 2015

බෞද්ධ මනෝ විග්‍රහය හා ආචාරධර්ම

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි　　　　කාලය : පැය 03 යි

---

## පළමුවන කොටස

01. බෞද්ධ මනෝ විශ්ලේෂණය චර්යාවෙහි හා අනුභූතියෙහි සහජීවනය තහවුරු කෙරෙන අධ්‍යයනයක් වශයෙන් අගය කළ හැකිදැයි පෙන්වා දෙන්න.

02. ''මිනිස් සන්තානය දුකින් පිරී ඇතැයි පවසන බෞද්ධ ඉගැන්වීම් එයට විසඳුම් ද ලබා දී ඇත.'' පැහැදිලි කරන්න.

03. ''බෞද්ධ මනෝ විශ්ලේෂණයෙහි දී මනෝ, චිත්ත, විඤ්ඤාන යන පදයන් සමාන අර්ථයන්හි යොදා ඇති බවක් දක්නට නැත.'' සාකච්ඡා කරන්න.

04. ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලිය මගින් සිදුවන උපාදාන ක්‍රියාවලිය මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. ''පෞරුෂය යනු මානසික හා කායික ගති ලක්ෂණ මගින් අධ්‍යයනය කළ යුත්තකි.'' බටහිර මනෝ විද්‍යාඥයන්ගේ මෙම ස්ථාවරය බෞද්ධ මනෝ විශ්ලේෂණය සමග කොතෙක් දුරට එකඟ වන්නේ දැයි සාකච්ඡා කරන්න.

## දෙවන කොටස

06. ''කර්මය හා සාංසාරික පැවැත්ම බෞද්ධ සදාචාර ධර්මයන්හි පදනම ශක්තිමත් කරයි.'' සාකච්ඡා කරන්න.

07. ''ශ්‍රමණ සම්ප්‍රදායය සමග සසඳන විට වෛදික සම්ප්‍රදාය තුළ සදාචාර ධර්ම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති බවක් දැක ගත හැකිය.'' විමසන්න.

08. ස්වාධීනව කටයුතු කිරීමේදී මිනිසාට ප්‍රමාණවත් නිදහසක් ලබා දීමට බෞද්ධ ඉගැන්වීම් සමත්ව ඇද්දැයි අදාළ සූත්‍ර දේශනා ඇසුරෙන් පරීක්ෂා කරන්න.

09. බෞද්ධ ඉගැන්වීම් පින හා කුසලය අර්ථවත් කොට ඇති ආකාරය අදාළ සූත්‍ර දේශනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

10. සමාජයෙහි සහජීවනය හා සාමකාමී පැවැත්ම සඳහා සදාචාර ධර්මයන්හි ඇති වැදගත්කම ප්‍රකට කරන්න.

**********************